**කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව**
**නීති පීඨය**

**නීතිවේදී උපාධි පරීක්ෂණය (පුනර්), පළමු වසර (මාර්ගගත) – 2020**
**(2021 පවත්වන ලද)**

**නීති විධික්‍රම**
(පැ තුනයි )

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : **06**

ප්‍රශ්න <u>**තුනකට (03)**</u> **පමණක්** පිළිතුරු සපයන්න.
(අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කෙරේ.)

---

01) "නීතිය" යන පදයට තනි අර්ථනිරූපණයක් නොමැත. ඇතැම් නීතිවේදීන් දක්වන ආකාරයට නීතිය වනාහි සමාජ සංසිද්ධියක් වන අතර නීතිය මිනිසුන්ගේ සමාජ අවශ්‍යතාවයන් සපිරිය යුතු වේ. එනමුදු ඇතැම් විචාරකයන් මෙම ප්‍රස්තුතයට එකඟ නොවේ.

ඔබ එකඟ වන්නෙහිද? ගැටෙන සමාජ අභිමතාර්ථයන්ට ප්‍රතිචාර දැක්වීමට නිර්මාණය කරන ලද නීතියක් හා අවශ්‍යයෙන්ම එසේ නොවන නීතියක් උපුටා දක්වමින් උක්ත ප්‍රකාශය සාකච්ඡා කරන්න. උචිත නීති විද්‍යාත්මක ගුරුකුල ඇසුරින් ඔබගේ පිළිතුර සනාථ කරන්න.

02) පැමිණිල්ල හා විත්තිය අතර තරඟකාරී ක්‍රියාදාමයක් තුලින් සත්‍ය සොයා ගැනීම කර ගැනීමට එදිරිවාදී නීති පද්ධතිය ප්‍රයත්න දරයි. එනමුදු විමර්ශනවාදී නීති පද්ධතිය, ක්‍රියාදාමය අධීක්ෂණය කරන විනිසුරුට වැඩි බලයක් පවරයි.

මෙම පද්ධති ද්විත්ත්වයෙහි විනිශ්චකාරතුමාගේ භූමිකාව කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කරමින් උක්ත ප්‍රකාශයෙහි වලංගුතාවය සම්බන්ධයෙන් විවේචනාත්මකව අදහස් දක්වන්න.

03) සීලනිකා රාජ්‍ය විවිධත්වයෙන් යුතු සංස්කෘතික කණ්ඩායම් හා ජනවර්ගයන්ගෙන් සමන්විත රාජ්‍යයකි. එම රාජ්‍යයේ ශින්දූමාලා කෝවිලෙහි භක්තිකයන් වන ටොන්ගො ජනතාව විසින්, කාන්තාවන් 'අපිරිසිදු' හා 'අශුද්ධ' ලෙස සළකන බැවින් ඓතිහාසික ශින්දූමාලා කෝවිල තුළට වයස අවුරුදු 12ත් 55ත් අතර කාන්තාවන් ඇතුළු නොවිය යුතු බව විශ්වාස කරයි. සීලනිකා රජය, 2021 අංක 10 දරණ කාන්තාවන්ට වෙනස්කොට සැළකීම් තහනම් කරන පනත නීතිගත කරයි.

එම පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව,

*ජීව විද්‍යාත්මක සාධක මත කාන්තාවන් හා ගැහැණු දරුවන් වෙනස්කොට සැළකීම්වලට භාජනය නොකළ යුතු වේ.*

කෝවිලෙහි වසර 1500 ඉතිහාසය සමරනුවස් 2021 වර්ෂයේ අගෝස්තු මාසයේදී, ශින්දූමාලා කෝවිලෙහි පූජකවරුන්ගේ සභාව ආගමික සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදි. පූජකවරුන් දැඩි ලෙස ප්‍රකාශ කර සිටියේ, චෝදිත අශුද්ධ ස්වභාවය හේතුකොට ගෙන කිසිඳු කාන්තාවකට අදාළ භූමියට ඇතුළු වීමට ශින්දූමාලා කෝවිලෙහි සම්ප්‍රදායය අවසර නොදෙන බවයි.

2021 සැප්තැම්බර් මාසයේදී, රාජ්‍ය නොවන සංවිධානයක් වන විණායා කාන්තා සංවිධානය විසින් කාන්තාවන්ට කෝවිලට ඇතුළු වීම තහනම් කිරීමේ ප්‍රකාශය අන්තර්ගත ආගමික සම්මන්ත්‍රණයේ වීඩියෝ පටයක් සොයාගන්නා ලද අතර ඒ අනුව පනතේ 3 වන වගන්තිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් ශින්දූමාලා කෝවිලෙහි පූජකවරුන්ට එරෙහිව චෝදනා එල්ල කරනු ලබයි. කෙසේ නමුත් එම චෝදනාව ප්‍රතික්ෂේප කරන සභාව හා භක්තිකයන්, අනන්‍ය වූ පුරුෂ සහභාගීත්වය වනාහි ශතවර්ෂ ගණනාවක් ඈතට දිවයන පෞරාණික ආගමික පරිචයක් වන බවට තර්ක කරති. ටොන්ගො ප්‍රජාවේ කාන්තාවන් හා පුරුෂයන් දෙපාර්ශවයම ඔවුන්ගේ උරුමයට කාවැදුණු පරිචයක් ලෙස මෙම චාරිත්‍රය සාම්ප්‍රදායිකව අනුගමනය කරන බව තවදුරටත් දක්වයි.

මෙම චාරිත්‍රයෙහි වලංගුතාවය සම්බන්ධයෙන් විණයා කාන්තා සංවිධානය ඔබේ උපදෙස් පතයි. උචිත අධිකරණ තීරණ ගෙනහැර දක්වමින් විණයා වෙත උපදෙස් දෙන්න. සීලනිකාහි නීති පද්ධතිය ශ්‍රී ලංකාවේ නීති පද්ධතියට සමාන වන බවට උපකල්පනය කරන්න.

04) අධිකරණමය තීරණ හා මතයන් නීතියේ සංවර්ධනය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරයි.

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නෙහිද? පොදු නීතියේ උරුමයක් ලෙස ශ්‍රී ලංකාවේ පවතින අධිකරණ පූර්ව නිදර්ශනයේ අදාළත්වය ඇසුරින් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න. අධිකරණ තීරණ ඇසුරින් ඔබේ පිළිතුර සනාථ කරන්න.

05) පසුගිය වසර කිහිපය තුළ ජෙමාලෑන්ඩ් රාජ්‍යයේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වුනු සයිබර් ප්‍රචණ්ඩත්වයන් ඉහළ යමින් පවතී. ජෙමාලෑන්ඩ් ආණ්ඩුව 2021 වර්ෂයේ දී රාජ්‍යයේ සමාජ නියාමය හා සදාචාරය සුරක්ෂිත කරලනුවස් අශෝභන හා අසභ්‍ය ක්‍රියා තහනම් කිරීමට නීතියක් සම්මත කරන ලදි.

2021 අංක 12 දරණ අශීලත්වය හා කාමෝද්දීපනය වැලැක්වීම සම්බන්ධ පනතේ 7 වන වගන්තිය මඟින්,
*අශෝභන හා අසභ්‍ය ක්‍රියාවල නිරතවන හෝ එවැනි ක්‍රියා ප්‍රසිද්ධ කරන ඕනෑම තැනැත්තෙකු මෙම පනත යටතේ වරදක් සිදුකරනු ලබන්නේ යයි දක්වයි.*

ජෙමාලෑන්ඩ්හි පුරවැසියන් වන මායා සහ රෝයා ඔවුන්ගේ සමලිංගික සම්බන්ධතාවය පවත්වාගෙන යාමේදී ඔවුන් මුහුණ දුන් දුෂ්කරතාවයන් සමාජ මාධ්‍යයක් ඔස්සේ හෙළිදරව් කරන ලදි. එමනිසා, පනතේ 7 වන වගන්තිය ප්‍රකාරව මායාට සහ රෝයාට එරෙහිව චෝදනා ගොනු කරන ලදි. මායා සහ රෝයා තර්ක කරනුයේ, පනත අර්ථනිරූපණය කරන ආකාරයේ කිසිඳු අශෝභන ක්‍රියාවක

තමන් නිරත නොවූ බවත්, තම ජීවන සහකරුව තෝරාගැනීමේ අයිතිවාසිකම තමන්ට පවතින බවත්ය.

මෙම නඩුව විනිශ්චය කරන විනිසුරුතුමා/තුමිය ඔබ යැයි උපකල්පනය කරමින් අදාළ ව්‍යවස්ථාව අර්ථනිරූපණය කිරීමට ඔබ විසින් අදාළ කරගනු ලබන ව්‍යවස්ථා අර්ථනිරූපණ රීතිය තෝරාගෙන එම තෝරාගැනීම සාධාරණීකරණය කරන්න. ජෙමාලැන්ඩ්හි නීති පද්ධතිය ශ්‍රී ලංකාවේ නීති පද්ධතියට සමාන වන බවට උපකල්පනය කරන්න.

06) ඔබ, ශ්‍රී ලංකාවේ ආරවුල් නිරාකරණය කිරීමේ විකල්ප පද්ධතියෙහි සඵලත්වය හා ක්‍රියාත්මකභාවය සම්බන්ධයෙන් නිර්දේශයන් ඉදිරිපත් කිරීමට අධිකරණ අමාත්‍යාංශය විසින් පත් කරන ලද කමිටුවේ සාමාජිකයෙක් වන බවට උපකල්පනය කරන්න. මෙම පද්ධතියේ අඩුලුහුඩුතාවයන් වෙතොත් ඒවා ගෙනහැර දක්වමින්, එම පද්ධතියේ ක්‍රියාත්මකභාවය වැඩිදියුණු කිරීමට නිර්දේශ යෝජනා කරමින් වාර්තාවක් සකස් කරන්න.

*****